# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2398/30 – 2024 අගෝස්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා – 2024.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය : 4655
විශේෂ්‍ය අංකය : මන්/09

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

උයිලන්කුලම, 10 වෙනි සැතපුම් කණුව යන ස්ථානයෙහි පදිංචි ලියනආරච්චිගේ බර්තොමියුස් ගුණතිලක මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව, මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට තබා ගැනීමට ඉඩ දෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

**නීතිඥ පණ්ඩුකාභය හර්ෂ කීර්තිනන්ද,**
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2024 අගෝස්තු මස 07 වැනි දින,
අංක 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම් දූපත ප්‍රා.ආ.නි. කොට්ඨාසයේ, පුන්කන්තාල්වු යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක මන් 168 හි, දැක්වෙන පුන්කන්තාල්වුකාඩු නමැති ඉඩමේ අක්කර 3 රූඩ් 0 පර්චස් 31 ප්‍රමාණ ඇති ලෙට් අංක 1 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ , පලතුරු හා ගොඩනැගිලිද,

2 උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම් දූපත ප්‍රා.ආ.නි. කොට්ඨාසයේ, පරප්පන්කන්දල් සිරුකුලම් යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක මන් 168 හි, දක්වෙන පරපන්කන්දල්කාඩු නමැති ඉඩමේ අක්කර 2 රූඩ් 2 පර්චස් 35 ප්‍රමාණ ඇති ලොට් අංක 2 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු හා ගොඩනැගිලිද,

3 උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම් දූපත ප්‍රා.ආ.නි. කොට්ඨාසයේ, ඉලුපායිකුලම් යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක මන් 168 හි, දක්වෙන ඉලුපායිකුලතුකානි, ඉලුපායිකුලතුකානි, ඉලුපායිකුලතුකාඩු රෝඩඩිකානි සහ පල්ලපුම් *හෙවත්* කඩ්ඩුකානි නමැති ඉඩම් වල අක්කර 11 රූඩ් 3 පර්චස් 14 ප්‍රමාණ ඇති ලොට් අංක 4 හා 7 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු හා ගොඩනැගිලිද,

4. උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම් දූපත ප්‍රා.ආ.නි. කොට්ඨාසයේ, ඉලුපායිකුලම් යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක මන් 168 හි, දක්වෙන ඉලුපායිකුලතුකාඩු *හෙවත්* ඉලුපායිකුලවායල් නමැති ඉඩම් අක්කර 4 රූඩ් 2 පර්චස් 10 ප්‍රමාණ ඇති ලොට් අංක 9 දරන බිම් කැබල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු හා ගොඩනැගිලිද වේ.

EOG 08 – 0265

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.